# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 152 — 1975 පෙබරවාරි 21 වැනි සිකුරාදා — 1975.02.21

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


## IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 137 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| කනතුරු—ඇබෑර්තු ... ... ... | 138 | අය-වැය ලේඛන ... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | දේපල විකිණීම ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | 141 | මාර්ග කොමිටි දැන්වීම් ... ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... | — | විවිධ දැන්වීම් ... ... ... | 141 |


සැ. යු.—(i) ජාතික රාජ්‍ය සභාවේ පළමුවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය, ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත, ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 2 දරන ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අනුස්මරණ ජාතික පදනම පනත, ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 3 දරන රජයේ ඉඩම් ආපසු ලබාගැනීමේ (අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලය) පනත, ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 4 දරන වීථි නාම කිරීමේ සහ ස්මාරක පිහිටුවීම පාලනය කිරීමේ පනත සහ ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 5 දරන මහා නගර සභා (සංශෝධන) පනත, 1975 පෙබරවාරි 21 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II කොටසේ අතිරේකයන් වශයෙන් පළවේ. (ii) මේ වර ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් පත්‍රයේ VI වැනි කොටසේ ජූරි සභිකයන්ගේ සහ උපදේශකවරුන්ගේ නාමාවලියක් ද පළවේ.

### පළාත් පාලන නිවේදන

**265 වෙනි අධිකාරය වන පළාත් පාලන (පාලන ප්‍රදේශ) ආඥාපනත**

පහත සඳහන් පත්වීම් කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

ශ්‍රී ලංකා පරිපාලන සේවයෙහි 2 වෙනි පන්තියේ පී. එම්. වයි. බී. පුස්සදෙණිය මහතා 1975 ජනවාරි මස 1 වෙනි දින සිට නැවත නියමයක් කරන තුරු මහනුවර ප්‍රදේශයේ පළාත් පාලන සහකාර කොමසාරිස් වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයෙහි 3 වෙනි පන්තියේ පී. එම්. ප්‍රේමතිලක මහතා 1975 ජනවාරි මස 1 වෙනි දින සිට නැවත නියමයක් කරන තුරු රත්නපුර ප්‍රදේශයේ පළාත් පාලන සහකාර කොමසාරිස් වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයෙහි 3 වෙනි පන්තියේ ඒ. එල්. අමරසිංහ මහතා 1975 ජනවාරි මස 1 වෙනි දින සිට නැවත නියමයක් කරනතුරු පොළොන්නරුව ප්‍රදේශයේ පළාත් පාලන සහකාර කොමසාරිස් වශයෙන්.

ඩී. රාජේන්ද්‍ර,
අතිරේක ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.

1975 ජනවාරි මස 31 වෙනි දින,
කොළඹ දී ය.

2-643–75.02.21 දින අංක 152 දරණ ගැසට් පත්‍රය

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශෙෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාදවී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.

1972 දෙසැම්බර් 15 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

නියම කරනු ලැබිය හැකිය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක් අන්කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iv) කිසිම අපේක්ෂකයෙකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකු වුවමනා නම්, ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයෙකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයක් ලබාගැනීමකට හෝ බලපැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත්, ඒ හේතුවෙන්ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේය.

(v) යම් අයදුම්කරුවෙකුගේ අයදුම්පතෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන්කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම්, ඒ හේතුවෙන්ම එම තනතුරට නුසුදුස්සකු බවට පත්කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුනි නම්, රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) පහත සඳහන් ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත (ඔහුගේ පෞද්ගලික නාමට නොවේ) එවිය යුතුයි.

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සළකා බලනු නොලැබේ. අයදුම්පතක් තැපෑලේදී ප්‍රමාද වූ බවට හෝ නැතිවූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු ස්වකීය අයදුම්පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ කුමූම ඒ අවදානමට මුහුණ පාති.

අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම් පත් ආකෘතිය

පළාත් පාලන සේවය

සැ.යු.—(i) අයදුම් පත්‍ර පහත සඳහන් ආකෘතියෙහි පිළියෙලකොට තනතුරු අදාළ වන ගැසට් නිවේදනයෙහි සඳහන්, අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු, කොළඹ 1, තැ.පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම් පත්‍ර ලේකම්ගේ පෞද්ගලික නාමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැළකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදාළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවන් වග බලාගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවන් ස්වකීය අයදුම් පත්‍රවලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රීසි, සිංහල, දෙමළ යන භාෂාවලින් සමත්වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (2) චරිත සහතිකය, (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදාලවන වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සදහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැලකිල්ල යොමු කරන්න.

........................තනතුර සඳහා වූ අයදුම් පත

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය :——
(ආ) ඉල්ලුම්කර සිටින තනතුර :——.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :——.
ජාතිය :——

(ඔබ ලියාපදිංචි වීමෙන් ලාංකිකයෙකු වී නම්, පුරවැසිභාවය පිළිබඳ සහතිකයේ දිනයත්, හැඳුනුම් අංකයත් සඳහන් කරන්න.)

3. තැපැල් ලිපිනය :——.
(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයට නියම් වයස :—

අවුරුදු :——. මාස :——. දින :——.

(ආ) උපන් දිනය :—

| අවුරුද්ද | මාසය | දිනය |
| --- | --- | --- |
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :——.

(ආ) අයදුම්කරුගේ පියා :——.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :——.

(ඈ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :——.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ), (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුය. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඈ) සහ (ඈ) පිරවිය යුතුය.)

6 විවාහක ද ? අවිවාහක ද ? වැන්දඹු ද ? :——.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

සාමාන්‍ය අධ්‍යාපනය

| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
| --- | --- | --- |
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| විද්‍යායතනය | සිට | දක්වා |
| --- | --- | --- |
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපනික සුදුසුකම් :—

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය/අ.පො.ස. (සාමාන්‍ය පෙළ)—

| | සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සම්මාන/විශිෂ්ඨ සාමාර්ථය |
| --- | --- | --- | --- | --- |
| පළමුවෙනි වාරය | | | | |
| දෙවැනි වාරය | | | | |

(ආ) අ. පො. ස. (උසස් පෙළ)—

| සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සම්මාන/විශිෂ්ඨ සාමාර්ථය |
| --- | --- | --- | --- |
| | | | |

(ඇ) වෙනත් උසස් අධ්‍යාපනික සුදුසුකම් :—

| විභාගයේ නම | සමත්වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් |
| --- | --- | --- | --- |
| | | | |

(ඈ) සමර්ථ වී ඇති උසස්ම විභාගය :—

(i) සිංහල ;——.

(ii) දෙමළ ;——.

(iii) ඉංග්‍රීසි ;——.

9. ලබාගෙන ඇති වෘත්තිය සහ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතනවල නම් :——

10. වෘත්තිය/කාර්මික/කර්මාන්ත පළපුරුද්ද :—

| ආයතනයේ නම | ආධුනිකත්වයේ ස්වභාවය/ දරූ තනතුර | සිට | දක්වා |
|---|---|---|---|
| | | | |

(සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි)

11. (අ) පාඨශාලාවෙන් අස් වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයන් හා අස් වූ දිනයන් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න) :————.

(ආ) මීට පළමු ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර, වශයෙන් හෝ තාවකාලික වශයෙන් හෝ රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න ————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු) පළාත් පාලනායතන හා කාලසීමාවන් :————.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත්වූ දිනය ;————.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද ? :— ————.

(ඉ) සේවාමුක්ත හටයෙක් නම්—සේනාංකය, තරාතිරම, සේවයට බැඳුන දිනය හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කථාකිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :—

(අ) සිංහල :————.
(ආ) දෙමළ : ————

13. විශේෂ සුදුසුකම්,—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම්, ඒ පිළිබඳව සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද, ? එසේ නම් දිනය, නඩු අංකය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස්ද ? එසේ නැත්නම්, ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කොපමණ ද ? :————.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————.

(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව, පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරන සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළයුතු නොවේ.)

මේ අයදුම් පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරාගනු ලැබීමට පළමු සොයාගනු ලැබුවහොත්, මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත්කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්,
තැ.පෙ. 530, කොළඹ 1.

---

## පළාත් පාලන සේවය

### සහකාර සෞඛ්‍ය පාලිකා තනතුරු

ඉහත සඳහන් තනතුරු සඳහා පළාත් පාලන සේවා දෙපාර්තමේන්තුව අයදුම්පත් කැඳවයි.

2. තනතුරට නියමිත ඒකාබද්ධ වැටුප් ක්‍රමය :—වර්ෂයකට රු. 5,592—144×7—180×1—රු. 6,780. එහි වර්ෂයකට රු. 618 යන වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉමක් ඇත. මීට අමතරව රජයේ නිලධාරීන්ට අදාළ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව විවාහක නිලධාරීන්ට විවාහක දීමනාවක් ද ගෙවනු ලැබේ. තෝරාගනු ලබන අපේක්ෂිකාවන් සුදුසුකම් හා පළපුරුද්ද අනුව සුදුසු වැටුප් පියවරක තැබීම ගැන සලකා බලනු ලැබේ.

3. අවශ්‍ය සුදුසුකම් :

(අ) වයස : 1975. 03. 27 වැනි දිනට වයස අවුරුදු 40 ට නොවැඩි විය යුතුයි. (පළාත් පාලන සේවයේ නොවන අයට) උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි.

(ආ) ඉල්ලුම්කරුවන්ට—

(1) පොදු සෞඛ්‍ය සේවිකා සහතිකය තිබිය යුතුයි.

(2) මහජන සෞඛ්‍ය හෙදි සහතිකය හෝ කොළඹ නගර සභාවේ ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුන විසින් පවත්වනු ලබන දෙපාර්තමේන්තුමය විභාගය සමත් වීමෙන් පසු නිකුත් කරනු ලබන සහතිකය යන මින් එකක් තිබිය යුතුයි. මහජන සෞඛ්‍ය හෙදි සහතිකය ඇති අයදුම්කරුවන්ට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ. (සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි.)

4. තෝරාගනු ලබන ඉල්ලුම්කරුවන් පළමුවරට කොළඹ මහ නගර සභාවේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට පත්කරනු ලබන අතර, නගර සභාව තුළ වාසය කිරීමට නියම කරනු ලැබේ. එහෙත් එක් එක් පළාත් පාලන ආයතනවලටද මාරුකිරීමට භාජනවිය යුතුය.

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට 1975 03. 27 වැනි දින හෝ ඊට පෙර මාවෙත ලැබෙන ලෙස එවිය යුතුයි.

සඳහන් කරන ලද ආකෘති පත්‍රයේ 9 වැනි කොටුව වෙනුවට පහත සඳහන් කරුණු යොදා ගත යුතුයි.

" (අ) පුහුණු පොදු සෞඛ්‍ය සේවිකාවක් ද ?

(ආ) සාත්තු සේවය පිළිබඳ ලබා ඇති සුදුසුකම් පිළිබඳ විස්තර"

7. අයදුම්පත්‍ර හෝ ඊට අදාල අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

8. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා හෝ විසින් එම අයදුම්පත්, අවසාන දිනට ප්‍රථම, ලැබුණු බවට සහතික කර, ප්‍රමාදයට හේතුව පිළිගත් හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණී.

ආර්. අබේරත්න,
පළාත් පාලන සේවා අධ්‍යක්ෂ.

1975 ජනවාරි මස 30 වැනි දින,
තැ. පෙ. 530,
කොළඹ 1.

2-649 –75.02.21 දින අංක 152 දරණ ගැසට් පත්‍රය

# අතුරු ව්‍යවස්ථා

**පුත්තලම නගර සභාව**

නගර සභා ආඥාපනත

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 153 වැනි හා 157 වැනි වගන්ති යටතේ පුත්තලම නගර සභාව විසින් සම්පාදිතව, එකී ආඥාපනතේ 154 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරණ ලද අතුරු ව්‍යවස්ථා.

ඩී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1975 පෙබරවාරි මස 5 වැනි දින,
කොළඹ දී ය.

**අතුරු ව්‍යවස්ථා**

1. පුත්තලම නගර සභාවේ පාලන සීමා ඇතුළත පිහිටි යම් මාර්ගයක සිට දැකිය හැකි පරිදි එම සීමා ඇතුළත වූ යම් ස්ථානයක

(1) එම ස්ථානය එකී කාර්ය සඳහා සුදුසු තැනැකැයි එදිනට බලයේ ඇති සභාව විසින් යෝජනාවකින් සම්මත කොට ඇත්නම් හා,

(2) මීට සම්බන්ධ උපලේඛනයෙහි නියමිත ගණන් අනුව ගාස්තුවක් ගෙවා සභාපතිගෙන් හෝ සභාපතිගෙන් බලයලත් නිලධාරියෙකුගෙන් එම කාර්ය සඳහා බලපත්‍රයක් ලබාගෙන ඇත්නම්, මිස, කිසිම තැනැත්තකු විසින් කිසිම දැන්වීමක් ප්‍රදර්ශනය නොකළ යුතුයි. කෙසේ වෙතත්, මෙම අතුරු ව්‍යවස්ථාවේ පූර්වෝක්ත විධි විධාන —

(අ) යම් ව්‍යාපාරයක අවශ්‍යතා සඳහා එම ව්‍යාපාර ස්ථානයේ, හෝ

(ආ) යම් ස්ථානයක් හෝ එම ස්ථානයේ බඩුමුට්ටු බදුදීම හෝ විකිණීම සඳහා ප්‍රචාරයක් වශයෙන් එම ස්ථානයේ හෝ, දැන්වීමක් ප්‍රදර්ශන කිරීම සම්බන්ධයෙන් බල නොපැයුතුයි.

2. 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සෑම කඩ කිරීමකටම රුපියල් පණහකට වැඩි නොවන දඩයකින් දඬුවම් දිය හැකි වන අතර කඩකිරීම දිගටම කෙරෙන කල්හි වරදකරු කිරීමෙන් හෝ එම කඩ කිරීම කෙරෙහි අවධානය යොමු කරවමින් සභාපතිගෙන් ලිඛිත දැන්වීමක් ලත් පසු හෝ කඩකිරීම කෙරෙහි සෑම දවසක් සඳහාම රුපියල් විසිපහකට වැඩි නොවන අතිරේක දඩයකින් දඬුවම් දිය හැකි විය යුතුය.

3. මෙම අතුරු ව්‍යවස්ථාවන්හි —

" දැන්වීමක් " යන්නෙන් ප්‍රචාරය සඳහා සම්පූර්ණයෙන් කොටස් වශයෙන් යම් වචනයක්, අක්ෂරයක්, ආදර්ශයක්, ලකුණක් ,ප්ලක් කට්ටුවක් යෙදුමක් හෝ නියෝජනයක් අදහස් කෙරේ.

" සභාපති " යන්නෙන් සභාවේ සභාපති අදහස් වේ.

" සභාව " යන්නෙන් පුත්තලම නගර සභාව අදහස් වේ.

" ආඥාපනත " යන්නෙන් 1939 අංක 61 දරණ නගර සභා ආඥාපනත අදහස් වේ.

" මංමාවතක් " යන්නෙන් 1939 අංක 61 දරණ නගර සභා ආඥාපනතේ දක්වා ඇති අර්ථයම නිරූපනය වේ.

**උපලේඛනය**

| | | බලපත්‍ර ගාස්තුව මාසයකට රු. ශ. | | බලපත්‍ර ගාස්තුව වර්ෂයකට රු. ශ. |
|---|---|---|---|---|
| 1. | තාප්පයක් හෝ වැටක ප්‍රදර්ශනය කෙරෙන (සිනමා දැන්වීමක් නොවන) දැන්වීමක් වර්ග අඩියකට ... ... | 1 0 | ... | 10 0 |
| 2. | පුවරුවක් මත හෝ යම් කෙනෙකු විසින් හෝ වාහනයක සවිකැරුණු ධාරනයක් මත ප්‍රදර්ශනය කෙරෙන (සිනමා දැන්වීමක් නොවන) දැන්වීමක් ; | | | |
| | (අ) දැන්වීම වර්ග අඩි හයකට වැඩි නොවන විට එක් වර්ග අඩියකට ... ... ... | 1 0 | ... | 10 0 |
| | (ආ) දැන්වීම වර්ග අඩි හයකට වැඩි වන විට එක් වර්ග අඩියකට ... ... ... ... | 1 50 | ... | 10 0 |
| 3. | සිනමා දර්ශනයකට අදාළ දැන්වීමක් සම්බන්ධයෙන් එක් වර්ග අඩියකට ... ... ... | 0 25 | ... | 2 50 |

2–484–75.02.21 දින අංක 152 දරණ ගැසට් පත්‍රය

# විවිධ දැන්වීම්

**පුත්තලම් දිස්ත්‍රික්කයේ මැදපළාත ගම්සභාව**

ගෝ ඝාතක ආඥාපනත

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ නම් සඳහන් අය විසින් ඔහුගේ නම ඉදිරියේ දැක්වෙන ස්ථානයේ 1975 වර්ෂයට මස් පිණිස සතුන් මැරීමට හා මස්කඩ පවත්වාගෙන යාමට බලපත්‍ර ඉල්ලා මා වෙත අයදුම්පත්‍ර ඉදිරිපත් කර ඇත. ඒ බැව් 272 වැනි අධිකාරය වන ගෝ ඝාතක ආඥාපනතේ 7 (2) වැනි වගන්තිය අනුව මෙයින් දැනුම්දෙමි. මෙම බලපත්‍ර නිකුත් කිරීම ගැන මැදපළාත ගම්සභා ප්‍රදේශ සීමාව තුළ යම් අයෙක් විරුද්ධ වන්නේ නම් ඒ කුමන හේතුන් නිසාදැයි යන වග සඳහන් කර ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින දාහතරක් (14) ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දන්වමි.

**උපලේඛනය**

| | ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | වෙළඳාම | | ස්ථානය |
|---|---|---|---|---|
| 1. | ඒ. ඩබ්ලිව්. එම්. ජාබීර්, ඉහල කොට්ටරාමුල්ල | හරක් මස් | ... | තුම්මෝදර යූ. එෆ්. එස්. ප්‍රනාන්දුට අයත් පහල කොට්ටරාමුල්ලේ පිහිටි නිදිකුම්බා වත්ත නොහොත් පරගහවත්ත කියන ඉඩම |
| 2. | ඒ. ඩබ්ලිව්. එම්. ජාබීර්, ඉහල කොට්ටරාමුල්ල | හරක් මස් | ... | දූන්කන්නාව ඇල්. ජේ. බී. ද සිල්වාට අයත් දූන්කන්නාවේ පිහිටි පුංචිදූන්කන්නාව නැමති ඉඩමේ ලොට් නොම්මර 1 දරණ කොටස |

ඒරන් අභයකෝන්,
සභාපති, මැදපළාත ගම්සභාව.

1975 පෙබරවාරි මස 07 වැනි දින,
මැදපළාත ගම්සභා කාර්යාලය,
තබ්බෝව, නාත්තන්ඩිය.

2–632—74.02.21 දින අංක 152 දරණ ගැසට් පත්‍රය

### උඩුබද්දාව ගම්ප්‍රදේශයේ පාලන නිලධාරි කාර්යාලය

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත (272 වැනි අධිකාරය)**

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වන අධිකාරය) 17 (1) දරන වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය පරිදි නිසි බලධරයාවූ ද, උඩුබද්දාව ගම් ප්‍රදේශයේ පාලන නිලධාරි තැනවූ ද, අභයරත්න වඩිගමංගාව වන මම, 1975 වර්ෂයේදී පහත සඳහන් දිනවලදී කුරුණෑගල දිස්ත්‍රික්කයේ උඩුබද්දාව ගම්ප්‍රදේශ සීමාවතුල මස් පිණිස සතුන් මැරීම සහ මස් වෙළෙඳාම් කිරීම සම්පූර්ණයෙන්ම මෙසින් තහනම් කරමි.

**උපලේඛනය**

1975 ජනවාරි 27 පුරපසලොස්වක් පෝය දිනය
1975 පෙබරවාරි 25 පුරපසලොස්වක් පෝය දිනය
1975 මාර්තු 26 පුරපසලොස්වක් පෝයදිනය
1975 අප්‍රේල් 25 පුරපසලොස්වක් පෝය දිනය
1975 මැයි 22 ශ්‍රී ලංකා ජනරජ දිනය
1975 මැයි 24 පුරපසලොස්වක් පෝය දිනය
1975 මැයි 25 පෝය දිනට පසු දිනය (වෙසක්)
1975 ජූනි 23 පුරපසලොස්වක් පෝය දිනය
1975 ජූලි 22 පුරපසලොස්වක් පෝය දිනය
1975 අගෝස්තු 21 පුරපසලොස්වක් පෝය දිනය
1975 සැප්තැම්බර් 19 පුරපසලොස්වක් පෝය දිනය
1975 සැප්තැම්බර් 26 බණ්ඩාරනායක ගුණානුස්මරණ දිනය
1975 ඔක්තෝම්බර් 04 ලෝක සත්ව දිනය
1975 ඔක්තෝම්බර් 19 පුරපසලොස්වක් පෝය දිනය
1975 නොවැම්බර් 18 පුරපසලොස්වක් පෝය දිනය
1975 දෙසැම්බර් 18 පුරපසලොස්වක් පෝය දිනය

අභයරත්න වඩිගමංගාව,
උඩුබද්දව ගම්ප්‍රදේශයේ පාලන නිලධාරී.

1975 පෙබරවාරි මස 10 දින,
උඩුබද්දුව ගම්ප්‍රදේශයේ පාලන නිලධාරි කාර්යාලයයේ දී ය.

2-653 —75.02.21 දින අංක 152 දරණ ගැසට් පත්‍රය

---

### මාතලේ මැදසියපත්තු ගම්සභාව

**මස් පිණිය සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත (272 අධිකාරය)**

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වෙනි අධිකාරය) 17 (1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මාතලේ මැදසියපත්තු ගම්සභාවේ සභාපති ඒ. බී. විජේසිංහ වන මම, 1975 වර්ෂයේ පහත සඳහන් උපලේඛනයෙහි දක්වෙන දිනයන්හි දී මාතලේ මැදසියපත්තු ගම්සභා සීමාව තුළ මස් පිණිස සතුන් මැරීම හා මස් වෙළඳාම සම්පූර්ණයෙන්ම මෙයින් තහනම් කරමි.

**උපලේඛනය**

1975 ජනවාරි 27—දුරුතු පුරපසලොස්වක් පෝය දිනය
1975 පෙබරවාරි 25—නවම් පුරපසලොස්වක් පෝය දිනය
1975 මාර්තු 11—මහා සිව රාත්‍රි දිනය
1975 මාර්තු 26—මැදින් පුරපසලොස්වක් පෝය දිනය
1975 මාර්තු 28—මහ සිකුරාදා
1975 අප්‍රේල් 25—බක් පුරපසලොස්වක් පෝය දිනය
1975 මැයි 1—මැයි දිනය
1975 මැයි 22—ශ්‍රී ලංකා ජනරජ දිනය
1975 මැයි 24—වෙසක් පුරපසලොස්වක් පෝය දිනය
1975 මැයි 25—වෙසක් පුරපසලොස්වක් පෝය දිනට පසු දිනය
1975 ජූනි 23—පොසොන් පුරපසලොස්වක් පෝය දිනය
1975 ජූලි 22—ඇසළ පුරපසලොස්වක් පෝය දිනය
1975 අගෝස්තු 21—නිකිණි පුරපසලොස්වක් පෝය දිනය
1975 සැප්තැම්බර් 19—බිනර පුරපසලොස්වක් පෝය දිනය
1975 සැප්තැම්බර් 26—බණ්ඩාරනායක අනුස්මරණ දිනය
1975 ඔක්තෝබර් 4—ලෝක සත්ව දිනය
1975 ඔක්තෝබර් 19—වප් පුරපසලොස්වක් පෝය දිනය
1975 නොවැම්බර් 18—ඉල් පුරපසලොස්වක් පෝය දිනය
1975 දෙසැම්බර් 18—උඳුවප් පුරපසලොස්වක් පෝය දිනය

ඒ. බී. විජේසිංහ,
මාතලේ මැදසියපත්තු ගම්සභාපති.

1975 පෙබරවාරි 10 දින,
ගම්සභා කාර්යලය,
උකුවෙල.

2-638 —75.02.21 දින අංක 152 දරණ ගැසට් පත්‍රය

---

### කොළඹ දිස්ත්‍රික්කයේ කඩුවෙල ගම්සභාව

**ගෝ ඝාතක ආඥාපනත**

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරිය) 17(1) දරණ වගන්තියෙන් පැවරී තිබෙන බලය ප්‍රකාර නියමිත අධිකාරී තැන වූ කඩුවෙල ගම් ප්‍රදේශයේ පාලන නිලධාරි පහත දක්වෙන උපලේඛනයේ දක්වෙන දිනයන්හි කඩුවෙල ගම් සභා සීමාව තුල මස් පිණිස සතුන් මැරීම හා මස් විකිණීම සම්පූර්ණයෙන්ම තහනම් කරනු ලැබේ.

**උපලේඛනය**

1975 ජනවාරි මස 27 වැනි දින—දුරුතු මස පුන් පොහොය දිනය
1975 පෙබරවාරි මස 25 වැනි දින—නවම් මස පුන් පොහොය දිනය
1975 මාර්තු මස 26 වැනි දින—මැදින් මස පුන් පොහොය දිනය
1975 අප්‍රේල් මස 25 වැනි දින—බක් මස පුන් පොහොය දිනය
1975 මැයි මස 22 වැනි දින—ජනරජ දිනය
1975 මැයි මස 24 වැනි දින—වෙසක් මස පුන් පොහොය දිනය
1975 ජූනි මස 23 වැනි දින—පොසොන් මස පුන් පොහොය දිනය
1975 ජූලි මස 22 වැනි දින—ඇසල මස පුන් පොහොය දිනය
1975 අගෝස්තු මස 21 වැනි දින—නිකිනි මස පුන් පොහොය දිනය
1975 සැප්තැම්බර් මස 19 වැනි දින—බිනර මස පුන් පොහොය දිනය
1975 සැප්තැම්බර් මස 26 වැනි දින—බණ්ඩාරනායක දිනය
1975 ඔක්තෝබර් මස 4 වැනි දින—ලෝක සත්ව දිනය
1975 ඔක්තෝබර් 19 වැනි දින—වප් මස පුන් පොහොය දිනය
1975 නොවැම්බර් මස 18 වැනි දින—ඉල් මස පුන් පොහොය දිනය
1975 දෙසැම්බර් මස 18 වැනි දින—උඳුවප් මස පුන් පොහොය දිනය

වී. ඩී. ඇල් මහින්ද,
පාලන නිලධාරි, කඩුවෙල ගම්ප්‍රදේශය.

කඩුවෙල ගම්සභා කාර්යාලය,
කඩුවෙල, 1975. 01. 30.

2-481 —75.02.21 දින අංක 152 දරණ ගැසට් පත්‍රය

---

### දළුගම සුළු නගර සභාව

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 272 අධිකාරය) 17 වැනි ඡේදය යටතේ නියෝගය**

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ (ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 272 වැනි අධිකාරය) 17 (1) ඡේදයේ ප්‍රකාර, කොළඹ දිස්ත්‍රික්කයේ දළුගම සුළු නගර සභාවේ පරිපාලන නිලධාරී, අමරවංශ සිරිසේන ද සිල්වා වන මා වෙත පැවරී තිබෙන බලය පරිදි, 1975 වර්ෂය තුල පහත දැක්වෙන දිනවලදී මස් පිණිස සතුන් මැරීම හා මස් විකිණීම මෙයින් තහනම් කරමි.

1. සෑම පුරපසලොස්වක් පෝය දිනය.
2. වෙසක් පුර පසළොස්වකට පසු දිනය.
3. ලෝක සත්ව දිනය.
4. බණ්ඩාරනායක ගුණානුස්මරණ දිනය.
5. මහ සිකුරාදා දිනය.

අමරවංශ සිරිසේන ද සිල්වා
පරිපාලන නිලධාරී,
දළුගම සුළු නගර සභාව.

1975. 02. 06. වැනි දින,
දළුගම සුළු නගර සභා කාර්යාලයේදී,
මහර-කඩවත.

2-642 —75.02.21 දින අංක 152 දරණ ගැසට් පත්‍රය

## අරණායක ගම්සභාව

### ගෝඝාතක ආඥාපනත

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වන අධිකාරය) 17 වෙනි ඡේදයේ (1) වැනි උප ඡේදය යටතේ නිසි බලධාරියා වන අරණායක ගම්සභාවේ සභාපති ඇන්. ඒ. පී. ගුණරත්න වන මම, යථෝක්ත ආඥාපනතේ මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර 1975 වර්‍ෂය තුළ මෙම ගම්සභා ප්‍රදේශයේ මස් පිණිස සතුන් මැරීම හා මස් වෙළඳාම පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන දින වලදී මෙයින් සම්පූර්ණයෙන් තහනම් කරමි.

#### උපලේඛනය

ජනවාරි 27 පසළොස්වක දින
පෙබරවාරි 25 පසළොස්වක දින
මාර්තු 26 පසළොස්වක දින
මාර්තු 28 මහ සිකුරාදා දින
අප්‍රේල් 25 පසළොස්වක දින
මැයි 22 ජනරජ දින
මැයි 24 වෙසක් දින
මැයි 25 වෙසක් දිනට පසු දින
ජූනි 23 පසළොස්වක දින
ජූලි 22 පසළොස්වක දින
අගෝස්තු 21 පසළොස්වක දින
සැප්තැම්බර් 19 පසළොස්වක දින
සැප්තැම්බර් 26 බණ්ඩාරනායක අනුස්මරණ දින
ඔක්තෝබර් 4 ලෝක සත්ව දින
ඔක්තෝබර් 19 පසළොස්වක දින
නොවැම්බර් 18 පසළොස්වක දින
දෙසැම්බර් 18 පසළොස්වක දින

ඇන්. ඒ. පී. ගුණරත්න,
අරණායක ගම්සභාවේ සභාපති.

ගම්සභා කාර්යාලය,
අරණායක,
75. 02. 05 වෙනි දින.

2-654—75.02.21 දින අංක 152 දරණ ගැසට් පත්‍රය

---

## බලංගොඩ නගරය

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකරය) 17(1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නියමිත අධිකාරී තැනවූද, බලංගොඩ නගරයේ විශේෂ කොමසාරිස් තැන්වූද, කාලවිල පතිරගේ දොන් සිබට් වන මම, 1975 වර්ෂයේ දී පහත දක්වෙන උපලේඛනයේ සඳහන් දින වලදී බලංගොඩ නගර සීමාව තුළ මස් පිණිස සතුන් මැරීම සම්පූර්ණයෙන්ම තහනම් කරමි.

#### උපලේඛනය

1975 ජනවාරි 5, 12, 20, 27.
1975 පෙබරවාරි 3, 11, 19, 25.
1975 මාර්තු 5, 13, 21, 26.
1975 අප්‍රේල් 3, 11, 19, 25.
1975 මැයි 3. 11, 18, 24.
1975 ජූනි 2, 10, 16, 23.
1975 ජූලි 1, 9, 16, 22, 31.
1975 අගෝස්තු 7, 14, 21, 30.
1975 සැප්තැම්බර් 6, 12, 19, 28.
1975 ඔක්තෝබර් 5, 12, 19, 28.
1975 නොවැම්බර් 3, 10, 18, 26.
1975 දෙසැම්බර් 3, 10, 18, 25.

කේ. ඩී. සිබට්,
විශේෂ කොමසාරිස්
බලංගොඩ නගරය.

1975. 02. 05 වෙනි දින,
බලංගොඩ විශේෂ කොමසාරිස් කාර්යාලයේ දී ය.

2—506–75.02.21 දින අංක 152 දරණ ගැසට් පත්‍රය

---

## වැලිමඩ සුළු නගර සභාව

### ගෝ ඝාතක ආඥාපනත

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වන අධිකාරය) 17 වෙනි ඡේදයේ (1) වැනි උප ඡේදය යටතේ නිසි බලධාරියා වන වැලිමඩ සුළු නගර සභාවේ සභාපති ඩබ්ලිව්. අමරියස් සිල්වා වන මම, යථෝක්ත ආඥාපනතේ මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර 1975 වර්ෂය තුළ මෙම නගර සභා ප්‍රදේශයේ මස් පිණිස සතුන් මැරීම හා මස් වෙළඳාම පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන දිනවලදී මෙයින් සම්පූර්ණයෙන් තහනම් කරමි.

#### උපලේඛනය

1975 ජනවාරි 27 පසළොස්වක දින.
1975 පෙබරවාරි 25 පසළොස්වක දින.
1975 මාර්තු 26 පසළොස්වක දින.
1975 මාර්තු 28 මහ සිකුරාදා.
1975 අප්‍රේල් 25 පසළොස්වක දින.
1975 මැයි 22 ජනරජ දින.
1975 මැයි 24 වෙසක් දින.
1975 මැයි 25 වෙසක් දිනට පසු දින.
1975 ජූනි 23 පසළොස්වක දින.
1975 ජූලි 22 පසළොස්වක දින.
1975 අගෝස්තු 21 පසළොස්වක දින.
1975 සැප්තැම්බර් 19 පසළොස්වක දින.
1975 සැප්තැම්බර් 26 බණ්ඩාරනායක අනුස්මරණ දින.
1975 ඔක්තෝබර් 4 ලෝකසත්ව දින.
1975 ඔක්තෝබර් 19 පසළොස්වක දින.
1975 නොවැම්බර් 18 පසළොස්වක දින.
1975 දෙසැම්බර් 18 පසළොස්වක දින.

ඩබ්ලිව්. අමරියස් සිල්වා,
සභාපති,
වැලිමඩ සුළු නගර සභාව.

1975 ජනවාරි මස 24 වැනි දින,
වැලිමඩ සුළු නගර සභා කාර්යාලයේ දී ය.

2-488—75.02.21 දින අංක 152 දරණ ගැසට් පත්‍රය

---

## නුවරඑළිය මහ නගර සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වන අධිකාරය) 17 (1) දරණ උප වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය පරිදි නිසි බලධාරියා වූ නුවරඑළිය මහ නගර සභාවේ නගරාධිපති වී. විලියම් ප්‍රනාන්දු වන මම, 1975 වර්ෂයේදී පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් දිනවලදී නුවරඑළිය මහ නගර සභා සීමාව තුළ මස් පිණිස සතුන් මැරීම සහ මස් විකිණීම සම්පූර්ණයෙන් තහනම් කරමි.

#### උපලේඛනය

(1) ජනවාරි 27—දුරුතු පුණු පසළොස්වක් පොහෝ දිනය
(2) පෙබරවාරි 25—නවම් පුණු පසළොස්වක් පොහෝ දිනය
(3) මාර්තු 26—මැදින් පුණු පසළොස්වක් පොහෝ දිනය.
(4) අප්‍රේල් 25—බක් පුණු පසළොස්වක් පොහෝ දිනය හා මහ සිකුරාදා දිනය
(5) මැයි 22—ජන රජ දිනය
(6) මැයි 24—වෙසක් පුණු පසළොස්වක් පොහෝ දිනය
(7) මැයි 25—වෙසක් පුණු පසළොස්වක් පොහෝ දිනයට පසු දිනය
(8) ජූනි 23—පොසොන් පුණු පසළොස්වක් පොහෝ දිනය
(9) ජූලි 22—ඇසල පුණු පසළොස්වක් පොහෝ දිනය
(10) අගෝස්තු 21—නිකිණි පුණු පසළොස්වක් පොහෝ දිනය
(11) සැප්තැම්බර් 19—බිනර පුණු පසළොස්වක් පොහෝ දිනය
(12) සැප්තැම්බර් 26—බණ්ඩාරනායක සමරු දිනය
(13) ඔක්තෝබර් 4—ලෝක සත්ව දිනය
(14) ඔක්තෝබර් 19—වප් පුණු පසළොස්වක් පොහෝ දිනය
(15) නොවැම්බර් 18—ඉල් පුණු පසළොස්වක් පොහෝ දිනය
(16) දෙසැම්බර් 18—උඳුවප් පසළොස්වක් පොහෝ දිනය.

වී. විලියම් ප්‍රනාන්දු,
නගරාධිපති,
නුවරඑළිය මහ නගර සභාව.

2-605—75.02.21 දින අංක 152 දරණ ගැසට් පත්‍රය

### තලවාකැලේ-ලිඳුල පළාත් ආණ්ඩු සභාව

**වාහන හා සත්ව බදු 1975**

පළාත් ආණ්ඩු සභා ආඥාපනතේ 162 වන වගන්තියේ 255 වන ඡේදය අනුව, 1975 වර්ෂය සඳහා වාහන හා සත්ව බදු වශයෙන් පහත සඳහන් බදු නැවත අළුත් කරන ලද බවත්, පළාත් ආණ්ඩු සභා 163 වගන්තියේ 3 වන ඡේදය අනුව මෙම ගාස්තු 1975 මාර්තු 31 දිනට පෙර ගෙවා බලපත්‍රය ලබා ගතයුතු බවත් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එඩ්මන් වණිගසේකර,
සභාපති,
තලවාකැලේ-ලිඳුල නගර සභාව.

1974 දෙසැම්බර් 31 දින,
තලවකැලේ-ලිඳුල පළාත් ආණ්ඩු සභා කායාීලයේදී ය.

| | රු. | ශ. |
|---|---|---|
| (1) මෝටර් කාර්, මෝටර් ලොරි, මෝටර් බයිසිකල්, රෝද තුනේ මෝටර් කාර්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම රථයකටම ... ... | 5 | 0 |
| (2) සෑම බයිසිකලයකට හෝ ට්‍රයිසිකලයකට, බයිසිකල් කාර් එකකට හෝ කරත්තයකට, ට්‍රයිසිකල් කාරයකට හෝ රෝද තුනේ කරත්තයකට.— | | |
| (අ) එය වෙළඳ කටයුත්තක් සඳහා යොදවන්නේ නම් ... ... | 5 | 0 |
| (ආ) එය වෙළඳ කටයුත්තක් නොවන වෙනත් කටයුත්තක් සඳහා යෙදේ නම් ... | 1 | 0 |
| ගොනුන් දෙදෙනෙක් යෙදූ සෑම කරත්තයකටම | 4 | 0 |
| තනි ගොනෙකු යොදන සෑම කරත්තයකටම... | 3 | 0 |
| සෑම අත් කරත්තයකටම ... ... | 3 | 0 |
| සෑම ජින් රික්ෂෝවකටම ... ... | 2 | 50 |
| සෑම පෝනියෙකුටම හෝ අශ්වයෙකුටම ... | 5 | 0 |
| සෑම බූරුවෙකුටම හෝ ගොනෙකුටම ... | 1 | 0 |

1975 සඳහා වූ මෙම වෙළඳ බලපත්‍ර 1974 වර්ෂයේදී තිබූ බලපත්‍ර ගාස්තුව වේ.

2-514—75.02.21 දින අංක 152 දරණ ගැසට් පත්‍රය

---

### කුලියාපිටිය නගර සභාව

**ජල භීතිකා රෝගය**

කුලියාපිටිය නගරසභා සීමාව තුල ජල භීතිකා රෝග උවදුර පවතින බැවින් එම නගරසභා සීමාව තුල පිහිටි පෞද්ගලික ගොඩනැගිල්ලක, ගෙමිදුලක හෝ ගෙවත්තක නොවන්නාවූ අන්‍ය ස්ථානයක හෝ පාරක හමුවන දඩාවතේ යන නැතහොත් බැඳ නොතබන ලද්දාවූ හෝ දක්කා ගෙන නොයනු ලබන්නාවූ කිසියම් සුනඛයෙකු (බල්ලකු හෝ බැල්ලියක) මා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලබන අයකු විසින් එවෙලෙහිම විනාශ කරනු ලබන බව (476 වැනි අධිකාරය වන) ජල භීතිකා ආඥාපනතේ 11 වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

මෙම නිවේදනය 1975. 01. 01 වැනි දින සිට 1975. 06. 30 වැනි දින දක්වා වලංගුව පවතී.

කිරිබණ්ඩා සත්කුමාර,
කුලියාපිටිය නගරයේ විශේෂ කොමසාරිස්.

1975. 01 01 වෙනි දින,
කුලියාපිටිය නගරයේ
විශේෂ කොමසාරිස් කාර්යාලයේදී ය.

2-562—75.02.21 දින අංක 152 දරණ ගැසට් පත්‍රය

---

### මූලතිව් සුළු නගර සභාව

**සුළු නගරසභා ආඥාපනත**

**1975 වර්ෂය සඳහා වූ විශේෂ කසළ ශෝධන බද්ද**

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 129 (ආ) වැනි වගන්තිය යටතේ මූලතිව් සුළු නගර සභාව විසින් අතුරු ව්‍යවස්ථා මගින් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම් හා නිදහස් කිරීම්වලට යටත්ව මූලතිව් නගරය තුළ පිහිටා ඇති සියළුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට හතර බැගින් වූ විශේෂ කසළ ශෝධන බද්දක් පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන්හි දී සමාන කොටස් හතරකින් ගෙවිය හැකි වන සේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන කොමසාරිස් විසින් දෙන ලද අනුමතිය ඇතිව 1975 වර්ෂය සඳහා පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්ලිව්. ඊ. වී. එස්. ද අල්විස්,
පළාත් පාලන කොමසාරිස්.

1975 පෙබරවාරි මස 06 වැනි දින,
කොළඹ දී ය.

2-560—74.02.21 දින අංක 152 දරණ ගැසට් පත්‍රය

---

### පෑලියගොඩ නගර සභාව

**1975 වර්ෂය සඳහා වූ වරිපනම් ලේඛණ**

පෑලියගොඩ නගර සභාවේ 1975 වර්ෂය සඳහා වූ වරිපනම් ලේඛණ දැන් සූදානම්ව කායාීල වේලාවන් තුළ පරීක්ෂා කර බැලීම සඳහා මෙම කායාීලයේ විවෘතව ඇති බව නගර සභා ආඥාපනතේ (255 වැනි අධිකාරය) 166 වෙනි වගන්තිය සමඟ කියවෙන මහ නගර සභා ආඥාපනතේ (252 වෙනි අධිකාරය) 235 (1) වෙනි වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිනු ලැබේ.

ජී. ඩී. ජේ. විජේසිංහ,
පෑලියගොඩ නගර සභාවේ සභාපති.

1975. 02. 05 දින,
පෑලියගොඩ නගර සභා කාර්යාලයේ දී ය.

2-607—75.02.21 දින අංක 152 දරණ ගැසට් පත්‍රය

---

### හාරිස්පත්තුව කුළුගම්මනසියපත්තුව ගම්සභාව

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත**

මෙහි පහත දක්වෙන උපලේඛණයේ නම් සඳහන් අය විසින් එහි සඳහන් ස්ථානයේ මස් විකිණීම සඳහා 1975 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධවන හාරිස්පත්තුව කුඩගම්මනසියපත්තුව ගම්සභා ප්‍රදේශය තුල පදිංචි ඕනෑම කෙනෙකුට තමා විරුද්ධවන්නේ අසවල් කාරණය සඳහායයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකකින් (2) යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවන දින සිට දින 14ක් ඇතුලතදී මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, 1947 අංක 44 දරණ ආඥාපනතේ 6 වැනි වගන්තියෙන් සංශෝධිත වූ මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වැනි පරිච්ඡේදයේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

එස්. ගුරුදෙනිය,
වැඩ බලන සභාපති,
කුළුගම්මනසියපත්තුව (හා.ප.) ගම්සභාව.

ගම්සභා කාර්යාලය,
වැරැල්ලගම,
1975 පෙබරවාරි මස 06 දින.

**උපලේඛනය**

| ඉල්ලුම්කරුගේ නම | බලපත්‍රයේ විස්තර | ස්ථානය |
|---|---|---|
| ඒ. ඇම්. පාරුක් ... ... ... ... | හරක් මස් වෙළඳාම ... | දලුක්කොටුව වත්ත, ඉණිගල |
| ඇම්. ඇම්. ඉසදීන් ... ... ... | හරක් මස් වෙළඳාම ... | දෙණියා වත්ත, උගුරැස්සපිටිය |

2-505—75.02.21 දින අංක 152 දරණ ගැසට් පත්‍රය

### කළුතර දිස්ත්‍රික්කය—පයියාගල් සහ මග්ගොන් බද්ද ගම් ප්‍රදේශය

### මස් පිණිස සතුන් මැරීම පිළිබඳ ආඥාපනත

මෙහි උපලේඛනයෙහි නම් සඳහන් අයවලුන් විසින් එහි දක්වෙන ස්ථානවල 1975 වර්ෂය තුල මස් කඩයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයේ ඉල්ලුම්කර ඇති බවත් මෙම බලපත්‍රය නිකුත් කිරීම ගැන පයියාගල් සහ මග්ගොන් බද්ද ගම් ප්‍රදේශය තුල පදිංචි ඕනෑම කෙනෙකුගේ හෝ සංවිධානයක විරුද්ධත්වයක් ඇත්නම් එය විස්තර සහිතව ලිපියකින් පිටපත් දෙකක් සහිතව සකස්කොට මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත එවීමට බලය ඇති බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරය) 7 (2) වගන්තිය යටතේ දැනුම් දෙමි.

#### උපලේඛණය

| ඉල්ලුම්කරුගේ ලිපිනය | බලපත්‍රයේ ස්වභාවය | ස්ථානය |
|---|---|---|
| ඇම්. ඒ. රහීම් මහතා, 9/3, සාවියා පාර, මහගොඩ, බේරුවල ... | ... එල හරක් මස් | ... කරඳගොඩ–එගොඩවත්ත |

මද්දුම බණ්ඩා හේරත්,
පයියාගල් සහ මග්ගොන් බද්ද ගම් ප්‍රදේශය.

1975 පෙබරවාරි මස 07 වන දින,
පයියාගල් සහ මග්ගොන් බද්ද ගම් ප්‍රදේශය,
පාලන නිලධාරි කාර්‍යාලය,
පයියාගල.

2–600–75.02.21 දින අංක 152 දරණ ගැසට් පත්‍රය

---

### අලව්ව සුළු නගර සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයේ දක්වෙන අය විසින් එහි සඳහන් ස්ථානයේ 1975 ජනවාරි මස 01 වෙනි දින සිට 1975 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වාවූ අවුරුද්දක කාලසීමාවේ මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා බලපත්‍ර ඉල්ලා අයදුම්පත් මා වෙත එවා තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වෙනි පරිච්ඡේදයේ 1947 අංක 44 දරණ සංශෝධිත ආඥාපනතේ 6 වෙනි වගන්තිය සහ සංශෝධණය කරන ලද 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

එකී බලපත්‍රය නිකුත් කිරීම ගැන අලව්ව සුළු නගර සභා ප්‍රදේශ සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, ඔහු හෝ ඇය එසේ විරුද්ධ වන්නේ කුමන හේතුන් නිසාද යනවග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුතුව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුලත මා වෙත එවිය යුතු බැව් මෙයින් දන්වා සිටිමි.

#### උපලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | වෙළඳාම කරන ස්ථානය | වෙළඳාම |
|---|---|---|---|
| 1. | ඇස්. සම්සුලාබ්දීන් මයා., 112, ප්‍රනාන්දු මාවත, මට්ටක්කුලිය ... | ... "ජනරජ" මාවත, අංක 01 | ... එළ හරක් මස් |
| 2. | එම | ... එම | ... එළු මස් |
| 3. | ජේ. ඒ. විජයහාමි මයා., පොදු වෙළඳපොල, වැල්ලවත්ත ... | ... "ජනරජ" මාවත, අංක 02 | ... එළ හරක් මස් |
| 4. | එම | ... එම | ... එළු මස් |

එච්. ඇම්. කුමාරදාස,
අලව්ව සුළු නගර සභාවේ සභාපති.

1975 පෙබරවාරි මස 05 දින,
අලව්ව සුළු නගර සභා කාර්යාලයේ දීය.

2–483–75.02.21 දින අංක 152 දරණ ගැසට් පත්‍රය

---

### නුවරඑළිය දිස්ත්‍රික්කයේ තිස්පනේ කෝරළේ ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අයවලුන් ඊට ඉදිරියෙන් දක්වා ඇති ස්ථානයන්හි මස් පිණිස සතුන් මරා මස් විකිණීම සඳහා 1975 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීම ගැන තිස්පනේ කෝරළේ ගම්සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධවන්නේ නම් ඒ කුමන කරුණක් නිසාද යනවග ඇතුළත් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුතුව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 14 ක් ඇතුළත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ (272 අධිකාරිය) 7(2) වෙන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. ආර්. ලියනගේ,
තිස්පනේ ගම්සභා ප්‍රදේශයේ පරිපාලන නිලධාරි.

1975.02.05 දින,
වටද්දර,
තිස්පනේ පරිපාලන නිලධාරි කාර්‍යාලයේ දීය.

#### උපලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම | බලපත්‍රයේ විස්තර | ස්ථානය |
|---|---|---|---|
| 1. | ශූ. ජේනුල් ආබදීන්, හපුගස්තලාව ... ... | ... එළ හරක් මස් වෙළඳාම | ... අංක 35, කලුදැමඩ, හපුගස්තලාව |
| 2. | ඒ. එල්. සනූර්දීන්, පොල්වතුර, නාවලපිටිය ... | ... එළ හරක් මස් වෙළඳාම | ... අංක 27, පොල්වතුර, නාවලපිටිය |
| 3. | ඒ. එල්. සනූර්දීන්, පොල්වතුර, නාවලපිටිය ... | ... එළ හරක් මස් වෙළඳාම | ... මල් ලංද, නාවලපිටිය |

2–482–75.02.21 දින අංක 152 දරණ ගැසට් පත්‍රය

### හැඳල සුළු නගර සභාව

### මස් පිණිස සතුන් මැරීම පිළිබඳ ආඥාපණත

මෙහි පහත දක්වෙන උපලේඛණයේ නම් සඳහන් අයවලුන් විසින් මෙහි දක්වෙන ස්ථානවල 1975 වර්ෂයට මස්කඩ පවත්වා ගෙන යාම සඳහා බලපත්‍ර ඉල්ලුම්කර ඇති බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීම ගැන, හැඳල සුළු නගර සභා ප්‍රදේශය තුළ පදිංචි ඕනෑම කෙනෙකුගේ විරුද්ධත්වයක් ඇත්නම්, එය විස්තර සහිතව ලියවිල්ලකින් පිටපත් දෙකකින් යුතුව, මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලැබෙන්ට සැලැස්විය යුතු බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පනතේ (272 වැනි අධිකාරය) 7 වෙනි වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

| ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | | වෙළඳාමේ විස්තරය | | ස්ථානය |
|---|---|---|---|---|
| 1. කේ. පාවුලු අප්පුහාමි, 41, බලගලවත්ත, හැඳල | ... ... | හරක් මස් එළු මස් සහ ඌරු මස් | ... | මාටගොඩ, මරදාන පාර |
| 2. එච්. හෙන්රි පෙරේරා, ඇලපිටිවල, රාගම | ... ... | එම | ... | කෙරවලපිටිය, පොකුණ හන්දිය අසල |

ඒ. ඩී. විල්බට්,
සභාපති,
සුළු නගර සභාව, හැඳල.

1975 පෙබරවාරි 5 වැනි දා,
සුළු නගර සභාව, හැඳල.

2-645—75.02.21 දින අංක 152 දරණ ගැසට් පත්‍රය

---

### කුරුණෑගල දිස්ත්‍රික්කය—කනෝගම ගම් සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණත

මෙහි පහත දක්වෙන උපලේඛණයෙහි නම් සඳහන් අය විසින් එහි දක්වෙන ස්ථානයෙහි 1975 වර්ෂයට මස්කඩයක් පවත්වාගෙන යාමට බලපත්‍රයක් ඉල්ලුම්කර සිටින බැවින් ඒ අනුව බලපත්‍රයක් නිකුත් කිරීම ගැන කනෝගම ගම් සභා ප්‍රදේශය තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධවීමට හේතු දක්වා පිටපත් දෙකකින් යුක්ත ලියවිල්ලකික් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත මාවෙත ලියා එවිය යුතු බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ (272 වෙනි අධිකාරය) 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

**උපලේඛණය**

| ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | | වෙළඳාම | | ස්ථානය |
|---|---|---|---|---|
| පී. ටී. අබුබක්කර්, මඩිගෙම්දියාල, බණ්ඩාරකොස්වත්ත | ... ... | එළුහරක් මස් | ... | හම්මාලියවත්ත |

ඩී. පී. ඩී. බන්ඩියා,
කනෝගම ගම්සභාවේ සභාපති.

1975 පෙබරවාරි 12 දින,
ගම් සභා කායර්‍යාලය,
කනෝගම, කටුපොත.

2-656—75.02.21 දින අංක 152 දරණ ගැසට් පත්‍රය

---

### කොහොක ගම් සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණත

මෙහි පහත දක්වෙන උපලේඛණයේ නම සඳහන් අය විසින් 1975 වර්ෂයට මස් කඩයක් පවත්වා ගෙන යාම සඳහා බලපත්‍රයක් ඉල්ලුම් කර ඇති බවත්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම ගැන කොහොක ගම් සභා ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධවන්නේ නම්, එසේ විරුද්ධවීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුතුව, ලියවිල්ලක් මගින්, මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත මාවෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ (272 වන අධිකාරය) 7 (2) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

**උපලේඛණය**

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | | වෙළඳාම | | වෙළඳාම් කරන ස්ථානය |
|---|---|---|---|---|
| සී. බී. වීරසූරිය මහතා, රිකිල්ලගස්කඩ | ... ... | එළු හරක් මස් | ... | අංක 26, රාගල පාර, රිකිල්ලගස්කඩ |

බී. ඒ. සී. ප්‍රනාන්දු,
සභාපති,
කොහොක ගම් සභාව.

1975 පෙබරවාරි 10 දින,
ගම් සභා කාර්යාලය,
කරදගොල්ල.

2-546—75.02.21 දින අංක 152 දරණ ගැසට් පත්‍රය

---

### නුවරඑළිය මහ නගර සභාව

### මහ නගර සභා ආඥාපනතේ 159 වන වගන්තිය යටතේ වූ නිවේදනය

### (ලංකා නීති සංග්‍රහයේ 252 වන අධිකාරය)

252 වන අධිකාරය වන මහ නගර සභා ආඥාපනතේ 159 වන වගන්තිය ප්‍රකාර, මෙම නිවේදනය රජයේ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් දින සිට, මෙහි පහත සඳහන් ප්‍රසිද්ධ වීථි, වීථි සීමා හෝ එහි යම්කිසි ස්ථානයක තබා, යම්කිසි ද්‍රව්‍යයක්, විකිණීම හෝ විකිණීම පිණිස ප්‍රදර්ශණය කිරීම නුවරඑළිය මහ නගර සභාව මගින් තහනම් කරනු ලබන බව, නුවරඑළියේ නගරාධිපති තාන්තුලගේ විලියම් ප්‍රනාන්දු වන මම මෙයින් නිවේදනය කරමි.

(1) මහනුවර පාර හෙවත් ශ්‍රීමත් බණ්ඩාරනායක මාවත—කච්චේරිය හන්දිය සිට ජනාධිපති මන්දිරයේ ප්‍රධාන දොරටුව දක්වා
(2) ජේම්ස් වීදිය—සම්පූර්ණයෙන්
(3) ලෝං වීදිය—සම්පූර්ණයෙන්
(4) හිල් වීදිය—මැකලම් ආයතන මාවතට සම්බන්ධ වන ස්ථානය දක්වා
(5) චැපල් වීදිය—සම්පූර්ණයෙන්
(6) කනගරත් නම් මාවත—සම්පූර්ණයෙන්
(7) මැකලම් ආයතන මාවත—සැන්ට් ඇන්ඩෲස් මංසන්ධියේ සිට රාජ්‍ය සේවා ක්‍රීඩා සමාජ ශාලාව පිහිටි ස්ථානය දක්වා
(8) එළිසබෙත් රැජින පාර—ජනාධිපති මැදුරේ ප්‍රධාන දොරටුවේ සිට බදුල්ලට සහ හානුඹයට හැරෙන මංසන්ධිය දක්වා

(9) අලුත් කඩවීදිය—කච්චේරිය මංසන්ධියේ සිට තැපැල් කායභාලය අසල එළිසබෙත් රජින මාවතේ ඡේදන ලක්ෂය දක්වා
(10) ලෝසන් වීදිය—සම්පූර්ණයෙන්
(11) ග්‍රෑන්ඩ් හෝටලය පාර—සම්පූර්ණයෙන්
(12) ශ්‍රීමත් ජයතිලක මාවත—සම්පූර්ණයෙන්
(13) උඩපුස්සැල්ලාව පාර—කච්චේරිය හන්දියේ සිට පොදු සේවා සාමාජිකයින්ගේ ක්‍රීඩා සමාජ ශාලාව දක්වා
(14) රතු කුරුස මාවත—දෙපස සම්පූර්ණයෙන්
(15) උද්‍යාන මාවත—දෙපස සම්පූර්ණයෙන්
(16) වෙබ්බර්න් පාර—දෙපස සම්පූර්ණයෙන්
(17) පල්ලිය පාර—දෙපස සම්පූර්ණයෙන්
(18) කඳපොල පාර—දෙපස සම්පූර්ණයෙන්

මෙම තහනම් නියෝගය කඩ කරන යම්කිසිවෙකු මහ නගර සභා ආඥාපනතේ 159 වන වගන්තිය යටතේ රුපියල් විස්සක දඩයකට යටත්වනු ලැබේ.

පී. විලියම් ප්‍රනාන්දු,
නුවරඑළියේ නගරාධිපති.

1975 ජනවාරි මස 31 වන දින,
නුවරඑළිය, මහ නගර සභා කායභාලයේ දීය.

2-509 —75.02.21 දින අංක 152 දරණ ගැසට් පත්‍රය

---

### කටුනායක සීදුව නගර සභාව

#### ගෝ ඝාතක ආඥාපණත—272 වැනි පරිච්ඡේදය

මෙහි පහත උපලේඛණයෙහි නම් සඳහන් අය එහි සඳහන් ස්ථානයේ 1975 වර්ෂයේ මස් පිණිස සතුන් මරා වෙළඳාම් කිරීම පිණිස බලපත්‍ර ඉල්ලා මා වෙත අයදුම් කර තිබෙන බව 272 වැනි පරිච්ඡේදය වන ගෝ ඝාතන ආඥාපණතේ 7 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

එම බලපත්‍ර නිකුත් කිරීම ගැන කොළඹ දිස්ත්‍රික්කයේ කටුනායක සීදුව නගර සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් කුමන කරුණු නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුතුව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත එවිය යුතුයි.

#### උපලේඛණය

| | ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|---|
| 1. | ඇම්. ඇස්. ඇම්. අසනුන් මයා., 46, සර් රසීඩ් පරීඩ් මාවත, මීගමුව | ... හරක් මස් වෙළඳාම ... | කුරණ කටුනායක කොට්ඨාශ අංක 1 |
| 2. | ඇස්. ඒ. ලවරෙන්තිනාහාමි මිය., 148, කොළඹ පාර, කටුනායක | ... හරක් මස් වෙළඳාම ... | කුරණ කටුනායක කොට්ඨාශ අංක 2 |
| 3. | ඇස්. ඒ. ලවරෙන්තිනාහාමි මිය., 148, කොළඹ පාර, කටුනායක | ... හරක් මස් වෙළඳාම ... | කටුනායක කොට්ඨාශ අංක 3 |
| 4. | ඇස්. ඒ. ලවරෙන්තිනා හාමි මිය., 148, කොළඹ පාර, කටුනායක | ... හරක් මස් වෙළඳාම ... | කටුනායක කොට්ඨාශ අංක 4 |
| 5. | ඇම්. ඇම්. ඉස්මයින් මයා., 59/35, මුස්ලිම් පල්ලිය පාර, මීගමුව | ... හරක් මස් වෙළඳාම ... | ලියනගේමුල්ල |
| 6. | ඇස්. ඒ. ලවරෙන්තිනා හාමි මිය., 148, කොළඹ පාර, කටුනායක | ... හරක් මස් වෙළඳාම ... | බණ්ඩාරවත්ත |
| 7. | කේ. මේරි වයලට් පෙරේරා මිය., ... ... | ... ඌරු මස් වෙළඳාම ... | නිරිපිටිවෙල හන්දිය |

ෂෙල්ටන් පැට්රික් පලියවඩන,
සභාපති,
කටුනායක සීදුව නගර සභාව.

1975. ජනවාරි 20 දින,
නගර සභා කාර්යාලය, සීදුව.

2-589—75.02.21 දින අංක 152 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළ කරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා නිවේදන භාර ගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන් අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛණයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වෙනවාත් හැර සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්‍යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරී වෙත කෙලින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

උපලේඛනය

1975

| මාසය | පළ කිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|
| පෙබරවාරි ... | 07.02.75 | සිකුරාද ... | 31.01.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 14.02.75 | සිකුරාද ... | 07.02.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 21.02.75 | සිකුරාද ... | 14.02.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 28.02.75 | සිකුරාද ... | 21.02.75 | සිකුරාද | දවල් | 12.00 |
| මාර්තු ... | 07.03.75 | සිකුරාද ... | 28.02.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 14.03.75 | සිකුරාද ... | 07.03.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 21.03.75 | සිකුරාද ... | 14.03.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 27.03.75 | බ්‍රහස්පතින්ද ... | 21.03.75 | සිකුරාද | දවල් | 12.00 |
| අප්‍රේල් ... | 04.04.75 | සිකුරාද ... | 27.03.75 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | 11.04.75 | සිකුරාද ... | 04.04.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 18.04.75 | සිකුරාද ... | 11.04.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 24.04.75 | බ්‍රහස්පතින්ද ... | 18.04.75 | සිකුරාද | දවල් | 12.00 |
| මැයි ... | 02.05.75 | සිකුරාද ... | 24.04.75 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | 09.05.75 | සිකුරාද ... | 02.05.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 16.05.75 | සිකුරාද ... | 09.05.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 23.05.75 | සිකුරාද ... | 16.05.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 30.05.75 | සිකුරාද ... | 23.05.75 | සිකුරාද | දවල් | 12.00 |
| ජූනි ... | 06.06.75 | සිකුරාද ... | 30.05.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 13.06.75 | සිකුරාද ... | 06.06.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 20.06.75 | සිකුරාද ... | 13.06.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 27.06.75 | සිකුරාද ... | 20.06.75 | සිකුරාද | දවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1975 ජනවාරි මස 01 වැනි දින,
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී